# අරණායක සැලව විහාරයේ කලාත්මක අගය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**දිසානායක ඩී. එම්.වී.**[1]

කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක සිට කිලෝමීටර් 5ක් පමණ දුරින් රහල දෙසට වන්නට දිස්ත්‍රික් මායිමේ සුන්දර සැලව ග්‍රාමයේ පිහිටි මෙම ලෙන් විහාරය සබරගමු පළාතේ පිහිටි පැරණිම ලෙන් විහාර අතරින් එකකි. වර්තමානය වන විට මෙහි පුරාවිද්‍යාත්මක වටිනාකම් විනාශ වෙමින් පවතී. මෙහි ඇති කලාත්මක වටිනාකම හඳුනා ගැනීමත් සිදුවන විනාශයන් අවම කොට ගැනීම සඳහා දැනුවත් කිරීමත් මෙහි අරමුණ වන අතර ක්ෂේත්‍ර මෙන්ම ක්ෂේත්‍ර නොවන ගවේෂණය මේ සඳහා යොදා ගන්නා ලදී. මෙහි ඉතිහාසය හෙළිදරව් කරන ප්‍රධාන සාධකය වන්නේ ලෙන් විහාර බිත්තියට සවි වන සේ කොටා ඇති පර්වත ලිපියයි. එයට අනුව මෙය කරවා ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයෙහි රාජගුරු අනුනායක මොරතොට ධම්මකන්ද හිමියන් විසිනි. බු.ව. 1771 දී ආරම්භ කළ විහාර කර්මාන්තය නිමකර ඇත්තේ බු.ව. 2349 දී බව සෙල්ලිපියේ සඳහන්ය. සැලව ලෙනේ දිග අඩි 118කි. පළල අඩි 18-22 අතර වේ. මෙහි විහාරයේ දකුණු පසින් හා බටහිරින් ගලෙන් බැඳි කණුමත පිහිටි බරාඳේ කොටස් දෙකකි. විහාර ලෙන, උඩ කුඩා විහාරය, කොනේ විහාරය හා ගබඩාව හෝ පරිවාර කාමරය ආදී වශයෙන් කොටස් හතරකි. විහාර මන්දිරය තුළ දකුණුපසින් අඩි 8ක් උසැති වේදිකාවක් මත පිහිටුවා ඇති සැතපෙන බුදු පිළිමයක් හා හිඳි හා හිටි පිළිම ඇත. බිත්තිවල අවකාශය මහනුවර යුගයේ හිඳි බුද්ධ රූපාවලියකින් සරසා ඇත. දෙවන ලෙනට ඇතුළු වීමට උළුවහු දෙකකි. මෙහි ඇති ප්‍රතිමා හා චිත්‍රකර්ම පසුකාලීන නවකම් නිසා ඓතිහාසික වටිනාකමින් හීන වී ඇත. මෙම විහාරය ජරාවාස වී තිබී බු.ව. 2471දී එවකට විහාරාධිපති වූ මහනුවර පුෂ්පරාම විහාරවාසී යටිවාවල ධම්මකන්ද රජගුරු හිමියන් විසින් අලුත්වැඩියා කළ බව බිත්තියේ සඳහන් කර තිබේ. එම අලුත්වැඩියාවේදී පැරණි ස්වරූපය වෙනස් කරන්නට ඇති බව පැහැදිලිය. එච්. සී. පී. බෙල්ගේ 1892 කෑගලු දිස්ත්‍රික් පුරාවිදු වාර්තාවේ මෙහි පැරණි චිත්‍ර හා ප්‍රතිමා ගැන සඳහන් කර තිබුණද ඒවායේ පැරණි ස්වභාවය විනාශ වී ගොස්ය. නැතහොත් ඒවා මත අලුතින් සායම් කොට ඇත. මෙහි විශාල සැතපෙන පිළිමයක් හිඳි හා හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් දැක ගැනීමට පුළුවන. නාථදේව ප්‍රතිමාවක් හා මොරතොට ධම්මකන්ද හිමිගේ චිත්‍රයක්ද මෙහි සිත්තම් කොට ඇත. තුන්වැනි ලෙන ගබඩාවක් වශයෙන් බෙල්ගේ වාර්තාවේ සඳහන් කර තිබුණද දැන් එය විහාරයක් බවට පත් කොට ඇත. සැලව රජමහ විහාරය ඉපැරණි සිතුවම් හා ඓතිහාසික වටිනාකමින් යුත් විහාරයක් ලෙස මෙහිදී පෙන්වාදිය හැකිය.

**ප්‍රමුඛ පද :** විහාරය, ලෙන, සිතුවම්, සැලව, ප්‍රතිමා

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. disanayakavishaka@gmail.com